**උඩුදුම්බර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිරවුල් කරන බව දන්වමි. |
| (ii) | මීමුරේ ප්‍රජාශාලාව පිහිටි ඉඩම රු.260,000 ක් හා රු.948,367 ක් ලෙස දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමේ නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමේ නිවැරදි කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,150,891 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.250,100 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | සමහර ශේෂ උපලේඛනවල ඇති බව හා 2020 ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 7 ක් හා ප්‍රාදේශීය සභාව විසින් බාහිර පාර්ශවයන් 9 කට නඩු පවරා තිබුණු අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමේ නිවැරදි කරන බව දන්වමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව තුළ වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ රු.343,113 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.1,475,305 ක් ඇතුළත් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම. | 2012 වර්ෂයේ සිට ලැබිය යුතු ව්‍යාපෘති මුදල් වන අතර අය කිරීමට ඇති හැකියාව විමසා බලා අයකර ගත නොහැකි මුදල් කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයහිමි වටිනාකම රු.31,901,551 ක් වූ අතර එහි ඇතුළත් වසර 5 ක් ඉක්මවූ ශේෂවල එකතුව රු.1,700,665 ක් හා වසර 1-5 ත් අතර ශේෂවල වටිනාකම රු.623,435 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදලින් ගෙවීමට සිදු නොවන රු.1,054,315 ක මුදල කපා හැරීමට මහා සභාවෙන් අනුමත වී ඇති බව දන්වමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.139,735,986 ක් වූ ඉඩම්වලට අදාළව හිමිකම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | තක්සේරුවකින් පසු ඔප්පු සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 15 දෙනා වෙත උත්සව අත්තිකාරම් ලෙස රු.300,000 ක මුදලක් ගෙවා තිබුණි. | උක්ත චක්‍රලේඛයෙන් උත්සව අත්තිකාරම් ගෙවිය හැක්කේ රාජ්‍ය සේවකයන්ට පමණි. | මෙම මුදල අය කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ආ) | අංක එන්පී/ ආර්ටීසී /ටීආර්/ සීඑම්/12/07 හා 2012 සැප්තැම්බර් 5 දිනැති ත්‍රීරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා වැඩපිළිවෙළක් හඳුන්වා දීම නැමැති අමාත්‍ය මණ්ඩල සංදේශය | ත්‍රීරෝද රථ සේවාව විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ත්‍රීරෝද රථ නියාමනය කර ගාස්තු අයකළ යුතු වේ. | ත්‍රීරෝද රථ සේවාව විධිමත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,082,077 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,864,707 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,300,800 | 2,224,875 | 2,088,887 | 399,099 | 1,322,000 | 650,604 | 1,518,749 | 466,760 |
| (ii) | කුලී | 2,933,000 | 2,964,035 | 2,075,420 | 880,352 | 2,115,000 | 2,981,952 | 1,963,040 | 125,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 471,000 | 503,000 | 348,100 | 338,200 | 890,000 | 1,149,950 | 1,166,200 | 411,900 |
| (iv) | වෙනත් ආදායම් | 3,941,900 | 5,978,390 | 1,505,157 | 3,251,713 | 36,582,279 | 2,013,807 | 2,286,897 | 141,030 |
| | | 9,646,700 | 11,670,300 | 6,017,564 | 4,869,364 | 40,909,279 | 6,796,313 | 6,934,886 | 1,144,690 |

### 2.2.2 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ජල පාරිභෝගිකයන්ගෙන් රු.544,661 ක ජල ගාස්තු හිඟයක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ රු.841,938 ක මුදලින් රු.297,277 ක මුදලක් මේ වන විට අයකර ඇති බව දන්වමි. |

### 2.2.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ට්‍රැක්ටරය හා බවුසරය කුලියට දීමෙන් වර්ෂ 5 ක කාලයක සිට අය නොවී පවතින රු.48,451 ක ශේෂයක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය වීමට ඇති පාර්ශව දැනුවත් කර ඇති බව දන්වමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.35,000 ක් හා මුද්දර ගාස්තු රු.3,796,394 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 4 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පුරනැගුම ව්‍යාපෘතියෙන් රු.42,160,398 ක් වැයකර ඉදිකළ හුන්නස්ගිරිය බහුකාර්යය ගොඩනැගිල්ලේ වර්ග අඩි 4870 ක ප්‍රමාණයක් ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් උත්පාදනය සඳහා කටයුතු කළද එය අසාර්ථක වී ඇති බැවින් නැවත ටෙන්ඩර් කර ලබාදීමට තීරණය කර ඇති බව දන්වමි. |
| (ii) | පුරනැගුම ව්‍යාපෘතිය මඟින් රු.57,130,000 ක් වැයකර ඉදිකළ උඩුදුම්බර ජල යෝජනා ක්‍රමයෙන් ජල සම්බන්ධතා 320 ක් ලබාදීම අරමුණු කරගෙන තිබුණද සම්බන්ධතා 175 ක් ලබාදී සවි නොකළ ජල මීටර් 145 ක් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබුණි. | සැලසුම්ගත ජල සම්බන්ධතා ලබාදීමට කටයුතු කළ යුතු වේ. | ජල සම්බන්ධතා 193 ක් ලබාදී ඇත. ජල ධාරිතාවය පිළිබඳ සලකා බලා ඉතිරි ජල සම්බන්ධතා දීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | 2019 වර්ෂයේ ග්‍රාම ශක්ති ගම්මානවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ කලුන්තැන්න විද්‍යාලය අසළ නල ළිඳ ඉදිකිරීමට රු.1,078,000 ක් වැයකර ඇතත්, ප්‍රතිලාභීන්ට පානීය ජලය ලබාදී නොතිබුණි. | ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ සැලසිය යුතු වේ. | මෙම සංවර්ධන යෝජනාවේ මුදල ගෙන්වා ගැනීමට බිල්පත් සකස් කර ඇති බවත් ගෙවීම් සිදු කිරීමේදී පරීක්ෂා කොට ගෙවීම් කරනු ලබන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2019 වර්ෂයේ ගම්පෙරළිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බඹරබැද්ද නැගෙනහිර, බඹරබැද්ද ජල යෝජනා ක්‍රමය සංවර්ධනය සඳහා රු.474,750 ක මුදලකට වැඩ නිමකර ගෙවීම්කර තිබුණ ද සැලසුමේ දුර්වලතා හේතුවෙන් ප්‍රතිලාභීන්ට පානීය ජලය ලබා දී නොතිබුණි. | ව්‍යාපෘතිය තුළින් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | 2019 වර්ෂයේ ගම්පෙරළිය - වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බඹරබැද්ද නැගෙනහිර, බඹරබැද්ද දේවින්නේගම නල ජල යෝජනා ක්‍රමය සඳහා රු.1355,307 ක් වැය කර තිබුණි. මෙම ජල ව්‍යාපෘතිය පරීක්ෂාවේදී ජල පොම්පයේ සිට ටැංකියට එලා තිබූ බට ඉවත්කර තනි නිවසකට ජල සබඳතාව ලබාදී තිබුණු අතර, ප්‍රජාවට ජලය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ග්‍රාම ශක්ති ගම්මානවල සංවර්ධන ව්‍යාපෘති වැඩ සටහන යටතේ පොප්පිටිය ශ්‍රී අභිනවාරාම විහාරස්ථානයේ නව සංඝාවාසය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂයය 03 යටතේ වහලය සඳහා මිලි මීටර් 0.47 ඝනකම වූ ඇළුමිනියම් ෂීට් සපයා සවිකිරීමට ඝන මීටර 324.48 ක් සඳහා ඝන මීටරයක් රු.2,216 ක් බැගින් රු.719,047 ක් සඳහා බිල්පත් අනුමත කර ඇතත්, මෙම වැඩවිෂයය ඉටුකර නොතිබුණි. කොන්ත්‍රාත්තුව නිමකර නොතිබුණු අතර, මුදල් ලැබීමේ අවදානම මත අතහැර දමා තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිමකර කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වේ. | මෙම සංවර්ධන යෝජනාවේ මුදල ගෙන්වා ගැනීමට බිල්පත් සකස් කළ අතර, ගෙවීම් සිදු කිරීමේදී පරීක්ෂා කොට ගෙවීම් කරනු ලබන බව දන්වමි. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොවුල්ගම කොම්පෝස්ට් අංගනයක් ස්ථාපිත කර කොම්පෝස්ට් අගල හා ගබඩාව සඳහා 2010 වර්ෂයේදී රු.3,487,828 ක මුදලක් ද, සමාලෝචිත වර්ෂයේදී රු.1,552,606 ක මුදලක් ද, යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට 2012 – 2017 වර්ෂවලදී රු.5,069,140 ක මුදලක් ද වැයකර තිබූ නමුත් ව්‍යාපෘතිය ද අසාර්ථක තත්ත්වයේ පැවතුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | කොම්පොස්ට් නිෂ්පාදනය මේ වන විට ආරම්භ කර ඇති බව දන්වමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු කරගත් අයවැය ලේඛනයක් 2021 වර්ෂයේදී සකස් කරන බව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| තනතුරු 12 කට අදාළ සේවක පුරප්පාඩු 22 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | බඳවා ගැනීමට කටයුතු කර වාර්තා කරන බව දන්වමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මනු සවිකර නොමැති පාරිභෝගිකයන් 207 කින් හා අක්‍රීය පාරිභෝගිකයන් 69 දෙනෙකුගෙන් ස්ථාවර ගාස්තු ලෙස ගෘහස්ථ රු.150 ක් සහ රාජ්‍ය ආයතන හා ව්‍යාපාරිකයන්ගෙන් රු.200 ක් අය කිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු නිවැරදි ආදායම අහිමිවී ගොස් තිබුණි. | ජලමනු සවිකර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ජලමනු සවි කිරීමට කටයුතු කර අදාළ අය කිරීමේ චක්‍රය අනුව අය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2019 වර්ෂයේ අඩු ආදායම්ලාභී පවුල් වලට සිමෙන්ති ලබාදීම සඳහා රු.723,795 ක් වැය කර තිබුණි. මෙහිදී ප්‍රතිලාභීන් දෙදෙනෙකුට රු.13,370 ක් වටිනා සිමෙන්ති මිටි 14 ක් ද ලබාදී නොතිබුණු අතර, ප්‍රතිලාභීන් තිදෙනෙකුට රු.5,730 ක් වටිනා සිමෙන්ති මිටි 6 ක් අඩුවෙන් ලබාදී තිබුණි. රු.39,105 ක් වටිනා සිමෙන්ති මිටි 36 ක් ලබාදුන් ප්‍රතිලාභීන් 6 දෙනෙක් ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ අධීක්ෂණය මත ද්‍රව්‍ය ආධාර ලබාදී පසු විපරම් කළ යුතුවේ. | සිමෙන්ති මිටි 566 ක් බෙදා දුන් අතර එවැනි විශාල තොගයක් ගබඩා කිරීමට ගබඩා පහසුකම් නොමැති බැවින් හාඩ්වෙයාර් එක තුළින්ම බෙදාහැර ඇත. ඉදිරියේදී ඍජුව අධීක්ෂණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2015 වර්ෂයේදී සභාව වෙත ලබා දී තිබුණු රු.25,616,323 ක් වටිනාකම වූ වාහන හා යන්ත්‍රෝපකරණ 2 ක් උපයෝජනය කර නොතිබුණි. | මෙම යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම යන්ත්‍රය සඳහා ක්‍රියාකරුවන් බඳවා ගැනීමෙන් පසු ආදායම් උත්පාදන කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව 2017 හා 2019 වර්ෂවල රුපියල් මිලියන 52 ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණ ද උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතුණි. | මෙම ශාලාව උපයෝජනය වැඩි කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රදේශයේ පවත්නා ඉල්ලුමේ ප්‍රමාණය අනුව උපයෝජනය අඩු මට්ටමක පවතී. සුබසාධනමය කටයුතු සඳහා නොමිලයේ ලබාදීමට සිදුවන අවස්ථා ඇත. |

### 3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව පවතින ට්‍රැක්ටරයක් නිෂ්කාර්යව කාර්යාල භූමියේ ගාල් කර තිබුණි. | වෙන්දේසි කළ යුතු වත්කම් වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිෂ්ක්‍රීය වත්කම් වෙන්දේසි කිරීමට නියමිත බව දන්වමි. |

## 3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වාහන දෙකක් වෙන්දේසි කිරීමේදී අවම ලංසුව නොදක්වා ටෙන්ඩර් දැන්වීම් පළ කිරීම හේතුවෙන් දෙවරක් ටෙන්ඩර් කිරීම නිසා සභාවට රු.91,494 ක පාඩුවක් සිදුවී තිබුණි. | සභා අරමුදලට පාඩු සිදු නොවීමට කටයුතු කළ යුතු වේ. | අවම ලංසුව දැක්වීම තුළින් ඉල්ලුම් කරනු ලබන වටිනාකම අඩුවිය හැකි බැවින් අවම ලංසුව දක්වා නොමැති බව දන්වමි. |